**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - II කොටස - 2017**

-------------------------------------------------------------

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන වේ. කලාප අතර ඉහළ සංචලතාවයක් පවත්වා ගැනීම සඳහා මීරිගම සිට කුරුණෑගල දක්වා කි.මී. 39.29 ක අධිවේගී මාර්ගය ඉදිකිරීම තුලින් වාහන නඩත්තු වියදම සහ මෙහෙයුම් වියදම, ගමන් කාලය, අනතුරු අඩුවීම සහ මඟී සුවපහසුව වැඩි කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කොටස් 04 කට බෙදා දේශීය කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රධානය කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 148,520 ක් වූ අතර එම මුදල දේශීය බලපත්‍රලාභී බැංකු හෝ දේශීයව ක්‍රියාත්මක වන අන්තර්ජාතික බැංකු මඟින් ලබා ගන්නා ණය මඟින් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා මහාභාණ්ඩාගාරය මඟින් තීරණය කර තිබුණි. 2016 දෙසැම්බර් මාසයේ දී කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබූ අතර 2017 වර්ෂයේ දී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2019 ජුලි මස වන විට නිමකිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 334.5 ක එකතු වටිනාකම වූ ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි සඳහා වූ පොලී මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. තවද, සිවිල් ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවිය යුතු රු.මිලියන 292 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලට ගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දිනට |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශ්‍රී ලංකා රජය | - | 2,140.00 | 1,115.50 | 1,259.80 |
| මහජන බැංකු ණය | 12,000.00 | - | 12,000.00 | 12,000.00 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව ණය | 13,017.70 | - | 13,017.70 | 13,017.70 |
| සම්පත් බැංකු ණය | 5,837.50 | - | 5,837.50 | 5,837.50 |
| **එකතුව** | 30,855.20 | 2,140.00 | 31,970.70 | 32,115.00 |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ උප කොන්දේසි අංක 14.6 ප්‍රකාර වටිනාකම රු. මිලියන 345.90 ක් වූ අතුරු ගෙවීම් සහතික වටිනාකම හෝ කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමින් සියයට 1 කට සමාන කළ වැඩ වටිනාකමක් ඇගයීම හා සහතික කිරීම සඳහා යොදාගත යුතුය. එසේ වුවත්, අතුරු ගෙවීම් වටිනාකම් රු.මිලියන 128.2 ක් සහ රු.මිලියන 292.2 ක් අතර වූ අතුරු ගෙවීම් සහතික සමාලෝචිත වර්ෂ අවස්ථා 04 ක දී ඉහත කොන්දේසියට පටහැනිව ඇගවීම් සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භක අවධියේදී විධිමත් බිම් මිනුමක් සිදුකිරීමට කටයුතු නොකිරීම නිසා කි.මී. 57+000 සිට කි.මී. 62+330 අතර සහ කි.මී. 63+950 සිට කි.මී. 69+500 අතර පිහිටි ගල් කැණීම මඟින් ඝන මීටර් 267,828 ක ගල් නිෂ්පාදනය කර තිබූ අතර එම ගල්වලින් ඝන මීටර් 170,909 ක් පමණක් මාර්ග ඉදිකිරීම් අවශ්‍යතාවය සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ හා වැඩ සැලසුම්වල විෂය පථය මාරු කිරීම වැනි සමහර හේතු නිසා කොන්ත්‍රාත් පැකේජ 04 ක මාර්ග ඉදිකිරීම් වැඩ බිම ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාද වී බාර දී තිබුණි. කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 15,217.8 ක් කාර්තුමය වශයෙන් ලබාදීම නිසා කොන්ත්‍රාත්කරුට අමතර මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබී තිබුණි. තවද, ප්‍රගති වාර්තා අනුව කොන්ත්‍රාත් පැකේජ අංක 03 ට අදාල

කොන්ත්‍රාත් වැඩවල නිරත කොන්ත්‍රාත්කරුවන් මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ 2019 ජනවාරි 10 වන විටත් සේවයේ යොදවා නොතිබුණි.

(ඈ) ප්‍රමාණවත් ජල විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව සකසන ලද මූලික මාර්ග ඉදිකිරීම් සැලසුම අනුව, කි.මී. 5.11 දිග ආරුක්කු පාලමක් සහ බෝක්කු 123 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ අතර මෙය කි.මී. 8.9 ක් දිග ආරුක්කු පාලමක් සහ බෝක්කු 167 ක් දක්වා වෙනස් කර තිබුණි. තවද, මෙම වෙනස්කම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහ ගොවි සංවිධානවල එකඟතාවයද ලබා ගෙන නොතිබුණි.